නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - හක්වටුනාඔය
வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் - ஹக்வடுனாஓய
Resident Project Management Office – Hakwatunaoya

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

21 AUG 2017
එගොඩගම මාවළිය
எகொடகம மாஎலிய
Egodagama Maeliva

මගේ අංකය / எனது இல. / My Ref No: 9/ 3/12
ඔබේ අංකය / உமது இல. / Your Ref No:
දිනය / திகதி / Date: 2017/08/04

01.ගොවි සංවිධාන නිලධාරින්,
නියෝජිත මහත්ම මහත්මින්,
02. රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ
ආයතන ප්‍රධානීන් /නිළධාරී මහත්ම මහත්මීන්

**2017 අගෝස්තු මස ව්‍යාපාර කමිටු රැස්වීමේ වාර්තාව-හක්වටුනාඔය ව්‍යාපාරය-2017/08/04**

හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ 2017 අගෝස්තු මස ව්‍යාපාර කමිටු රැස්වීම 2017/08/04 දින පෙ.ව.10.00 ට නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ප්‍රධානත්වයෙන් හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පවත්වන ලදි.

**01.විශේෂ ආරාධිතයින්**

1. විශේෂ ආරාධිත අමුත්තන් ලෙස අස්ගිරිය මැදමහා විහාරස්ථානයේ දායක සභාවේ උපුල් මුදන්නායක මහතා සහ බතලගොඩ නේවාසික ව්‍යාපාර කළමනාකාර ඊ.එම්.ජේ.කේ.එදිරිසූරිය මහත්මිය සහභාගී විය.

**02. සහභාගීත්වය - රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන්**

2. ඩබ්.එම්.ඩී ගාමිණී කුසුම් ශ්‍රියානන්ද - නේවාසික ව්‍යාපාර කළමනාකරු - හක්වටුනාඔය
3. ජී.ආර්.අයි.එස්.ගමලත් - ඉංජිනේරු සහකාර (වාරිමාර්ග දෙපාර්තමේන්තුව)
4. ඊ.එම්.ජේ.කේ.එදිරිසූරිය - නේවාසික ව්‍යාපාර කළමනාකරු - බතලගොඩ
5. එම් .එච් නයනී මංගලිකා කුමාරි - සංවර්ධන නිළධාරි
6. ජී.පී.එස්.පෙරේරා - සංවර්ධන නිළධාරී
7. එච්.එම්.ටී කේ වික්‍රමරත්න - සංවර්ධන නිළධාරි
8. එන්.ඩබ්.පී.එන්.කුමාරි - සංවර්ධන නිළධාරි
9. ටී.එම්.අයි.එස්.තෙන්නකෝන් - සංවර්ධන නිළධාරී ( වාරිමාර්ග දෙපාර්තමේන්තුව)
10. ඊ.එම්.යූ.ජයවර්ධන - ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
11. කේ.එන්.එස්.පද්මසිරි - කෘ.ප.නි.සහකර - (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව)
12. එම්.පී.ජේ.ඩී.ගුණතුංග - කෘ.ප.නි.සහකර - (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව)

**ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්**

1. ඊ.එම් ජයතිලක--ගරුසභාපති (ව.ඉ කුලංකට්ටය අලුත්වැව බෙ.ගොවි.සං)
2. ඩී.එම් එන්.ජේමචන්ද්‍ර--ගරුසභාපති (ද.ඉ යාය 07 ඇනිකට් ඇල බෙ.ගොවි.සං)
3. එච්.එම් මුදියන්සේ-- ගරුසභාපති (ද.ඉ යාය 06 බෙ.ගොවි.සං)
4. ඩී.එම්.යූ. පතිරාජ-- ගරුසභාපති ( ව.ඉ ඩී.07 ආගම බෙ.ගොවි.සං)
5. කේ.ඩී.පියදාස -- ගරු භාණ්ඩාගාරික ( ව.ඉ ඩී 07 ආගම බෙ.ගොවි.සං)
6. බී.වික්‍රමසිංහ -- ගරු ලේකම් ( ව.ඉ ඩී 07 ආගම බෙ.ගොවි.සං)
7. ආර්.ඩී.ගුණතිලක-- ගරු සභාපති (ව.ඉ.ඩී.4 ට්‍රැක් 7 කම්බුව බෙ.ගොවි.සං)
8. කේ.වී.අමරතුංග-- ගරු සභාපති (ව.ඉ.ඩී.6 වදුරස්ස බෙ.ගොවි.සං)
9. ඊ.එම්.විජේසූරිය ඒකනායක-- ගරු සභාපති (ව.ඉ.ඩී.3 සිසිල්පොකුණ බෙ.ගොවි.සං)
10. එච්.එම්.පී.කුමාරි-- ගරු භාණ්ඩාගාරික (ව.ඉ.ඩී.3 සිසිල්පොකුණ බෙ.ගොවි.සං)
11. ජී.එච්.එම්.ඒකනායක- ගරු ලේකම් (ව.ඉ.ඩී.3 සිසිල්පොකුණ බෙ.ගොවි.සං)
12. ඩී.එම්.එස්.ජී.දිසානායක -- ගරු භාණ්ඩාගාරික (ව.ඉ.දෙමටගොල්ල බෙ.ගොවි.සං)

13. ජේ.පී.ඒ.ආර්.එම්.ජයසූරිය -- ගරු ලේකම් (ව.ඉ.දෙමටගොල්ල බෙ.ගොවි.සං)
14. ඩබ්.ආරියරත්න-- ගරු ලේකම් (ව.ඉ.යාය 5-6 ඩී 3 අගාර කටුගම්පල බෙ.ගො.සං)
15. එච්.එම්.සී.බී.හේරත්-- ගරු භාණ්ඩාගාරික (ව.ඉ.යාය 5-6 ඩී 3 අගාර කටුගම්පල බෙ.ගො.සං)
16. එස්.එම්.තිලකරත්න-- ගරු ලේකම්(ද.ඉ යාය 07 ඇනිකට් ඇල බෙ.ගොවි.සං)
17. යූ.යූ.අනුර--ඇල නියෝජිත(ද.ඉ යාය 07 ඇනිකට් ඇල බෙ.ගොවි.සං)
18. ඒ.එම්.යූ.කේ.කරුණාරත්න-- ගරු ලේකම්(ද.ඉ යාය 3 ඩී 8 සියඹලාවැව බෙ.ගොවි.සං)
19. ආර්.එම්.දිසානායක -- ගරු සභාපති (ද.ඉ යාය 3 ඩී 8 සියඹලාවැව බෙ.ගොවි.සං)
20. ඊ.ගුණරත්න-- ගරු ලේකම් (ව.ඉ.ඩී.6 වදුරස්ස බෙ.ගොවි.සං)
21. කේ.වී.අමරතුංග-- ගරු සභාපති (ව.ඉ.ඩී.6 වදුරස්ස බෙ.ගොවි.සං)
22. ඒ.එම්.ආර්.අතපත්තු--ගරු සභාපති (ද.ඉ.යාය1-2 තලාකොළවැව බෙ.ගොවි.සං.)
23. ඩබ්.එම්.විජිතසිරි- ඇල නියෝජිත (ද.ඉ.යාය1-2 තලාකොළවැව බෙ.ගොවි.සං.)
24. ආර්.එම්.නවරත්න බණ්ඩාර-ඇල නියෝජිත (ද.ඉ.යාය1-2 තලාකොළවැව බෙ.ගොවි.සං.)
25. ඊ.එම්.සිසිරකුමාර-ගරු ලේකම් (ද.ඉ.යාය1-2 තලාකොළවැව බෙ.ගොවි.සං.)
26. ඩබ්.වී.දැනියෙල් අප්පුහාමි-ඇල නියෝජිත(ව.ඉ.ඩී1 උඩයට පාලගම බෙ.ගොවි.සං.)
27. ආර්.එම්.නිමල් --වාරිමාර්ග- (ජල පාලක)
28. එස්.ඒ.උදයකුමාර-- වාරිමාර්ග- (ජල පාලක)
29. ඩබ්.බී.ජෙරාට් --වාරිමාර්ග- (ජල පාලක)

<u>**03.**</u> ප්‍රථමයෙන් ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිළධාරීන්, ගොවි සංවිධාන නිළධාරීන් සහ ගොවි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භකරන ලදී.

<u>**04. 2017** ජූලි මස ව්‍යාපාර කමිටු රැස්වීමේ වාර්තාව සභාසම්මත කිරීම.</u>

**2017/07/11** දින පැවැති ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් සභාවේ ඒකමතිකව සභාසම්මත විය.

<u>**05.**ආයතන සංවර්ධන කටයුතු -</u> නේවාසික ව්‍යාපාර කළමනාකරු-හක්වටුනාඔය ව්‍යාපාරය

- ව්‍යාපාරයේ බෙදුම්ඇල ගොවි සංවිධානවල **2017** වර්ෂයේ ජනවාරි සිට ජූනි යන මාස හය තුළ පැවැත්වීමට නියමිතව තිබූ නිලවරණ කටයුතු පවත්වා අවසන් කර ඇති බවත්,
- මූල්‍ය කළමනාකරණය දෙවන අදියර පිළිබඳව පුහුණුවක් මෙම මස තුළදී පැවැත්වෙන බවත් ඊට ගරු භාණ්ඩාගාරික සහ ගණන් පරීක්ෂක තනතුරු දරන පුද්ගලයින්ගේ සහභාගීත්වය අපේක්ෂා කරන බවත්,
- 2017 යල කන්නය වගා කිරීමට ප්‍රමාණවත් වර්ෂාවක් නොලැබූ මහාවාරි ව්‍යාපාරවලට වර්ෂාව අපේක්ෂාවෙන් "අගහස් පූජාව" නමින් 2017/08/09 සහ 10 දිනයන්හි දී පවත්වනු ලබන බෞද්ධාගමික පූජාවට සියලුම ගොවි සංවිධානවල නියෝජිතයන්ගේ සහ ගොවීන්ගේ සහයෝගය ලබාදිය යුතු බවත් දැනුම්දෙන ලදී.

<u>**06.** වාරිමාර්ග දෙපාර්තමේන්තුව</u>

ජී.ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර, හක්වටුනාඔය ප්‍රධාන ජලාශයේ අද දින වනවිට ජල මට්ටම අඩි 13 ක් අඟල් 6ක් වන බවත්, එය අක්කර අඩි 9 155ක් බවත්, එයින් මළ ධාරිතාව ඉවත්කළවිට අක්කර අඩි 5 133ක් පවතින බවත්, ප්‍රධාන ජලාශයේ ඉස්මත්තේ පස් හා බොරළු ඉවත් කිරීම ආරම්භ කර ඇති බවත්, ප්‍රධාන වැවේ රක්ෂිතයේ අනවසර වගාවන් සිදුකරන ගොවීන් සම්බන්ධයෙන් සාකච්ඡා කර වැඩපිළිවෙලක් සිදුකළයුතු බවත් දන්වන ලදී.

## 07.ගොවි සංවිධාන නිලධාරීන් හා රාජ්‍ය නිලධාරීන්ගේ ගැටළු, අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරිම.

ද.ඉ.යාය 5 කොරුවාගාල බෙ.ගො.සං.-ගරු සභාපති- සියලුම ප්‍රදේශයන්ට පවතින ජල හිඟය හේතුවෙන් ඊට පිළියම් ලෙස ප්‍රධාන ජලාශයෙන් ජලමුරයක් නිකුත්කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

වම් ඉවුර ඩී 6 වදුරස්ස බෙ.ගො.සං.-ගරු සභාපති- ප්‍රදේශයේ පානීය ජල ළිං සිඳී ගොස් ඇති බවත්, මිනිසුන්ට එදිනෙදා වැඩකටයුතු සිදුකරගන්නට වත් ජලය නොමැතිකම හේතුවෙන් හක්වටුනා ඔයට ජල මුරයක් නිකුත් කිරීම සුදුසු බව පවසන ලදී.

වම් ඉවුර ඩී.4 ට්‍රැක් 7 තම්බුව බෙ.ගො.සං.-ගරු සභාපති - ප්‍රධාන ජලාශයෙන් ජල මුරයක් නිකුත් කළත් ළිං වල ජලය මට්ටම ඉහළ නොනගින බවත්, දැනට ඇලවල නිර්මිත කඩා ඉවත් කර තිබීම හේතුවෙන් ජලය අගාවත දක්වා ගෙන යා නොහැකි බවත්, ඒ හේතුවෙන් ජලය නිකුත් කිරීම සුදුසු නොවන බව තම අදහස බව පවසන ලදී.

දකුණු ඉවුර යාය 6 බෙ.ගො.සං.-ගරු සභාපති- ප්‍රධාන ජලාශයෙන් ජලය නිකුත් කරත් ඇල පද්ධතියේ ඉහළ ඇති වැව් අමුණු පිරී යාමෙන් අනතුරුව යාය 6 වැනි අගාවතේ ගොවි සංවිධානවලට ජලය රැගෙන යාම කිසිසේත්ම සිදුනොවන බවත්, ජලය නිකුත් නොකරන ලෙස තම ඉල්ලීම බවත් පවසන ලදී.

වම් ඉවුර ඩී 7 දාගම බෙ.ගො.සං.-ගරු භාණ්ඩාගාරික- ප්‍රධාන ජලාශයෙන් ජලය නිකුත් කරනවානම් සියලුම ගොවි සංවිධානවලට ප්‍රයෝජනවත් වන පරිදි සමසේ බෙදිය යුතු බවත්, අතීතයේදී ද මෙවැනි නියං කාලවලදී ප්‍රධාන ජලාශයෙන් ජල මුරයක් නිකුත් කර ඇති බවත්, එම සෑම අවස්ථාවක දී ම අගාවතේ ගොවි සංවිධානවලට අසාධාරණයක් සිදුවී ඇති බවත්, එම හේතුවෙන් ප්‍රධාන ජලාශයෙන් ජල මුරයක් නිකුත් කිරීම ප්‍රායෝගික නොවන බවත් දන්වන ලදී.

ජී.ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර - ඉදිරියේදී වර්ෂාව බලාපොරොත්තුවෙන් සහ ගොවි සංවිධාන නියෝජිතයන් ගේ අදහස් අනුව ජල මුරයක් නිකුත් නොකරන බව දැනුම් දෙන ලදී.

| අනු අං. | ඉදිරිපත් කළ අය | ගැටළුව | විසඳුම |
|---|---|---|---|
| 01 | වම් ඉවුර ඩී 3 සිසිල්පොකුණ බෙ.ගොවි සං.-ගරු සභාපති | CRIP ව්‍යාපෘතියේ සිසිල්පොකුණේ වේල්ල සාදමින් සිටි කොන්ත්‍රාත්කරුගේ සේවකයන් වැඩ අවසන් නොකරම ඉවත්ව යා ඇති බවත්,ඩී 3 දොර සිසිල්පොකුණ ගමේ ජයරත්න මහතා ගළවා රැගෙන යා ඇති බවත්,සාකච්ඡා කිරීමට ගැටළු රාශියක් තිබුණත් ඉංජිනේරුතුමා වත් ව්‍යාපාර කමිටු රැස්වීමට සහභාගී නොවන බවත්, ප්‍රධාන ජලාශයේ ඉස්මත්තේ කරන පස් කැපීම හා බොරළු කැපීම විනිවිදභාවයකින් යුතුව ව්‍යාපාර | ජී.ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර - අදාල කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡාවක් ඉදිරියේ දී පවත්වන බවත්, ප්‍රධාන ජලාශයේ ඉස්මත්තේ බොරළු කැපීම සහ පටවා දීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සිදුකරන බවත්, කොන්ත්‍රාත්කරු මඟින් බොරළු ලබාගත හැකි බවත්, දන්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | කම්ටුවවත් දැනුවත් කර සිදුකළ යුතුබවත්, දැනුවත් නොකර වැඩ පටන් ගෙන තිබීම වරදක් බවත් පවසන ලදී. අතර මඟ නවතා ඇති ව්‍යාපෘතියේ වැඩ පිළිබඳව වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාරගත යුතු බවත්,දැනට නිර්මිත පවතින තත්ත්වයට වඩා ඉදිකිරීම් පටන්ගන්නට පෙර කාලයේදී තිබූ නිර්මිතවල තත්ත්වය හොඳ බව පවසමින් ගොවීන්ගෙන් ගොවි සංවිධාන නිලධාරීන්ට දොස් අසන්නට සිදුවී ඇති බවත් දන්වන ලදී. | |
| 02 | ඒකාබද්ද ගොවි සංවිධානය-ගරු සභාපති | ඒකාබද්ද ගොවි සංවිධානයට ප්‍රධාන ජලාශයේ ඉස්මත්තේ පස් කැපීම හා බොරළු කැපීම සඳහා අවසර පතක් සාදාගැනීමට ඉල්ලීමක් සිදුකළත්, සිතියම් ගත කිරීමට නිලධාරීන් ජලාශයට පැමිණෙන බව දැනුම්දුන් දින හෝ එම වේලාවට නොපැමිණි බවත්, පසුව ගොවි සමිතිවල නියෝජිතයන් නොමැතිව ගොස් සිතියම් ගත කර ඇති බවත්, එයට අවසර දී සිතියම් ගතකර ඇති ප්‍රදේශයේ පස් හෝ බොරළු නොමැති බවත් දන්වන ලදී. | .ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර - නැවත සිතියම් ගත කිරීමක් ඉල්ලුවොත් සිදුකළ හැකි බව පවසන ලදී. |
| 03 | දකුණු ඉවුර යාය 5 බෙ.ගොවි සං.-ගරු සභාපති | CRIP ව්‍යාපෘතියේ ඩී **13 – C** ඇලේ වැඩකරන කොන්ත්‍රාත්කරු පස් ඉවත් කර නොමැති බව දන්වන ලදී. | ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර - එම ඇල හා ප්‍රධාන බැම්ම පස් පිරවීම පිළිබඳව කොන්ත්‍රාත්කරුව දැනුවත් කර ඇති බව දන්වන ලදී. |
| 04 | ද.ඉ.යාය **1-2** තලාකොළවැව බෙ.ගො.සං-ගරු සභාපති | දකුණු ඉවුර ප්‍රධාන ඇල පස් ඉවත් කර පාර පුරවන කාර්යය අතරමඟ නවතා දමා ඇති බවත්, එය සිදුකරන දින කවදාදැයි විමසන ලදී. | ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර- දකුණු ඉවුර ප්‍රධාන ඇල පස් ඉවත් කර පාර පුරවන කාර්යය ඉදිරි සතිය තුළ නැවත වැඩ පටන්ගන්නා බව දන්වන ලදී. |
| 05 | වම් ඉවුර ඩී.**4** ට්‍රැක් 7 තම්බුටුව බෙ.ගො.සං.-ගරු සභාපති | 34 - 8 CRIP ව්‍යාපෘතියේ වැඩ කටයුතු පිළිබඳ විමසීමක් කරන ලදී. | ආර්.අයි.එස්.ගම්ලත් - ඉංජිනේරු සහකාර- අදාල සියළුම ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට ප්‍රගති සමාලෝචන රැස්වීමක් ළඟදීම පැවැත්වෙන බව දන්වන ලදී. |

**08.** ගෙවිජන සේවා දෙපාර්තමේන්තුව - ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී - රඹේ කලාපය

නියං කාළගුණික තත්ත්වය හේතුවෙන් මේ කන්නයේ විවිධ වගාවල නිරත වී ඇති ගොවීන් 1071 ක් පමණක් ඇති බවත්, 2016/17 මහ කන්නයේ වගා කටයුතු සිදුකර විනාශයට පත්වූ වගාවන් ට වගා වන්දි ගෙවීම රඹේ කලාපයේ **988** දෙනෙකුට පමණක් සිදුකර ඇති බවත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 47 000කට මේ වන විට නියං ආධාර ලබාදී ඇති බවත්, තවත් 58 000 කට ගෙවීමට ඉතිරිව ඇති බවත්, එයට තව රුපියල් කෝටි **91.4** ක් පමණ අවශ්‍යතාවයක් පවතින

බවත් ඉදිරියේදී ගෙවීමට කටයුතු සලසන බව රජයේ ආරංචි මාර්ග වලින් දැනුවත් කර ඇති බවත් පවසන ලදී.

නයගයත් සමගම වැව් ඉස්මත්තේ ළිං කැපීම මේ දිනවල සිදුකිරීම සුලභ දසුනක් බවත්, එහිදී ළිං කැපීමට පෙර අදාල ප්‍රදේශයේ අවසරය ලබාගත යුතු නිලධාරීන් ගේ අවසරය ලබාගෙන, ළිං පසුව නැවත වසාදමන බවට පොරොන්දු වී සිදුකරගන්නා ලෙසත්, අනවසරයෙන් ළිං කැපීම සිදුකර නිලධාරීන් සහ තමනුත් අපහසුතාවයට පත් නොකරන ලෙසත් කාරුණිකව දැනුම් දෙන බවත් පවසන ලදී.

**09. අස්ගිරිය මැදමහා විහාරස්ථානයේ දායක සභාවේ උපුල් මුදන්නායක මහතා - අගසස් පූජාව පිළිබඳව දැනුවත් කිරීම.**

2017/08/09 සහ 10 යන දිනයන් හිදී තලාකොළවැව ශ්‍රී බෝධිමළු විහාරස්ථානයේ පැවැත්වීමට සංවිධානය කර ඇති ප්‍රාතිහාර්යාත්මක සර්වඥ ධාතු වන්දනාව, ආශිර්වාදාත්මක සම්බුද්ධ වන්දනාව, බුද්ධානුස්සතිය හා සෙත් පිරිත් දේශනාව, අසුගත චීවරය රන් ඉදිකටුවෙන් මැසීම හා වන්දනා කිරීම, මුරුතැන් බත පූජාව, අෂ්ඨපාන පූජාව, මිටිහාල් දන්සැල, ලදපස් මල් පූජාව, එලවැල පූජාව, අටවිසි ගිලන්පස පූජාව, භේසජ්ජ පාන පූජාව හා පාන වර්ග දන්සැල ආදී ආකාරයේ වූ බුද්ධෝපස්ථාන වන්දනා සකස්කරන ආකාරය සහ පැවැත්වීම පිළිබඳව දීර්ඝ දේශනයක් සිදුකරන ලදී.

මෙම දැනුවත් කිරීම් වලින් සහ සාකච්ඡා වලින් අනතුරුව, රැස්වීමට සහභාගී වූ සියලුම රාජ්‍ය නිළධාරී මහත්ම මහත්මීන්ට හා ගොවි සංවිධාන නියෝජිතත මහත්ම මහත්මීන්ට සහ අගසස් පූජාව පිළිබඳව දැනුවත් කිරීමට අස්ගිරි මහාවිහාරයෙන් පැමිණ සිටි මහත්මයාට තම විශේෂ ස්තුතිය පිරිනමමින් නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

..........................................

ඩබ්.එම්.ඩී.ගාමිණී කුසුම් ශ්‍රියානන්ද,
නේවාසික ව්‍යාපාර කළමනාකරු.
හක්වටුනාඔය ව්‍යාපාරය.

E. M. ...........................

ගරු ලේකම්,
ව්‍යාපාර කළමනාකරණ කමිටුව

පිටපත්:-.

1. අධ්‍යක්ෂ-වාරිමාර්ග කළමනාකරණ අංශය-කොළඹ (කා.දැ.පි)
2. දිස්ත්‍රික් ලේකම්තුමා-කුරුණෑගල(කා.දැ.පි)
3. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්-කුරුණෑගල (කා.දැ.පි)
4. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ- කුරුණෑගල (කා.දැ.පි)
5. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ- කුරුණෑගල (කා.දැ.පි)
6. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් - කුරුණෑගල (කා.දැ.පි)
7. ප්‍රාදේශීය ලේකම් -පොල්පිතිගම-(කා.දැ.පි)
8. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ-ගල්ගමුව (කා.දැ.පි)
9. දිස්ත්‍රික් කළමනාකරු-පොහොර ලේකම් කාර්යාලය(කා.දැ.පි)
10. වාරිමාර්ග ඉංජිනේරු-ඉබ්බාගමුව-(කා.දැ.පි)

11. ගොවිජන සේවා ප්‍රදේශීය සංවර්ධන නිළධාරී-රඹේ (කා.දැ.පි)
12. සහකාර අධ්‍යක්ෂ-කෘෂි රක්ෂණ මණ්ඩලය -කුරුණෑගල (කා.දැ.පි)
13. මුලස්ථාන කෘෂිකර්ම උපදේශක- රඹේ (කා.දැ.පි)
14. කළමනාකරු- (ලංකා බැංකුව,මහජන බැංකුව,ග්‍රාමීය බැංකුව) (කා.දැ.පි)
15. අදාල වසම්වල කෘ.ප.නි.ස.නිළධාරී මහත්ම මහත්මීන් (කා.දැ.පි)
16. සියලුම ගොවි සංවිධානවල නිලධාරී මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය(කා.දැ.පි)

---


නේවාසික ව්‍යා.කළමනාකරු / RPM } 0373378771
ෆැක්ස් / Fax }
ඊ මේල් / E-mail } **hakwatunawa@gmail.com**